GALADARI

COLOMBO

# ගලදාරි හොටෙල්ස් (ලංකා) පී එල් සී - PQ 137

## කොටස්හිමියන් වෙත කරනු ලබන දැන්වීමයි
## අතිවිශේෂ මහ සභා රැස්වීම 2024 අප්‍රේල් 18 වැනි දින

ගලදාරි හොටෙල්ස් (ලංකා) පී එල් සී (''සමාගම'') අති විශේෂ මහ සභා රැස්වීමක් 2024 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 3.30 ට අංක 64, ලෝටස් පාර, කොළඹ 01 යන ලිපිනයේ පිහිටි ගලදාරි හොටෙල්ස් (ලංකා) පී එල් සී හි අධ්‍යක්ෂමණ්ඩල කාමරයේ සිට අතථ්‍ය **(Virtual)** රැස්වීමක් ලෙසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම්දෙනු ලැබේ. එහිදී ප්‍රධාන ගනුදෙනුවකට අදාළ යෝජනාවක් සම්මත කිරීම සුදුසුදැයි යන්න ගැන සළකා බලා එය සම්මත කිරීම සිදු කෙරෙනු ලැබේ.

**ගලදාරි හොටෙල්ස් (ලංකා) පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි**
**සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**සමාගම් ලේකම්වරු**

**සටහන්:**

1. කොටස් හිමියන් සඳහා වන චක්‍ර ලේඛය, අති විශේෂ මහ සභා රැස්වීම කැඳවීමේ නිවේදනය, පෙර කලාසි ආකෘතිය සහ අතථ්‍ය **(Virtual)** අති විශේෂ මහ සභා රැස්වීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටියට සම්බන්ධ තොරතුරු කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවියඃ www.cse.lk) සහ සමාගමේ වෙබ් අඩවියඃ **(www.galadarihotel.lk)** වෙත පිවිස ලබාගැනීමේ හැකියාව කොටස් හිමියන්ට ඇති අතර, ඔබට අවශ්‍යනම් **URL: www.galadarihotel.lk/about** සැබැදිය හරහා ඉහත ලේඛණ වෙත සෘජුවම ප්‍රවේශ විය හැකිය.

2. ඉහත සඳහන් වෙබ් අඩවියක් වෙත පිවිස මෙම නිවේදනයේ සම්පූර්ණ අන්තර්ගතය පරීක්ෂාකර බලන ලෙසට කොටස් හිමියන්ට උපදෙස් දෙනු ලැබේ.

3. ඉහත සඳහන් වෙබ් අඩවිවල සමගාමී ප්‍රකාශනය සමග මෙම දැන්වීම, සමාගමේ සමාගම් ව්‍යවස්ථාවට අනුකූලව අති විශේෂ මහ සභා රැස්වීම පිළිබඳ කරනු ලබන නිසි දැනුම් දීමක් ලෙසින් සළකනු ලැබේ. මෙම දැන්වීමේ සහ අදාල ලියකියවිලි වල දෘඪ පිටපත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට සමාගම කටයුතු කරනු නොලැබේ.

4. අධ්‍යක්ෂමණ්ඩලය, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ සමාගම් ලේකම්වරුන් සහ රෙජිස්ට්‍රාර්වරුන් ඇතුළු රැස්වීමේ විධිවිධාන පරිපාලනය සඳහා අත්‍යාවශ්‍ය අය පමණක් අංක 64, ලෝටස් පාර, කොළඹ 01 යන ලිපිනයේ පිහිටි ගලදාරි හොටෙල්ස් (ලංකා) පී එල් සී හි අධ්‍යක්ෂමණ්ඩල කාමරයේ භෞතිකව රැඳී සිටීමට හැකිය.

5. රැස්වීමේදී ඔහු/ඇය වෙනුවෙන් සහභාගීවීමට, කතා කිරීමට සහ ඡන්දය දීමට පෙරකලාසිකරුවෙක් පත් කිරීමට කොටස් හිමියෙකුට හිමිකම් ඇත. එම පෙරකලාසිකරු කොටස් හිමියෙකු විය යුතු නැත.

නිසි පරිදි සම්පූර්ණකරන ලද පෙරකලාසි පෝරමය අති විශේෂ මහ සභා රැස්වීම පැවැත්වීම සඳහා නියම කරන ලද වේලාවට පැය හතළිස් අටකට (48) පෙර සමාගමට ලබාගත හැකිවන පරිදි, අංක 48, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07 දරණ ලිපිනයේ පිහිටි සමාගමේ, සමාගම් ලේකම්වරුන් සහ රෙජිස්ට්‍රාර් වරුන් වන සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත තැපැල් කිරීම හෝ ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් **egm@galadari.lk** වෙත හෝ/සහ **cccs@tiruchelvam.com** වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කළයුතුය. අති විශේෂ මහ සභා රැස්වීමට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන ඕනෑම විමසීමක් සඳහා 0112544544 දිගුව 251 යන අංකයෙන් අජන්තා ඇන්ටන් මහත්මිය සම්බන්ධ කරගන්නා ලෙසට සියලුම කොටස් හිමියන්ගෙන් ඉල්ලීමක් කරනු ලැබේ.

GALADARI
COLOMBO

64, Lotus Road, Colombo 01, Sri Lanka
Tel: 94 11 2544544, Fax: 94 11 2544585, 94 11 2449875